**සීමාසහිත මහවැලි සත්ත්ව ව්‍යාපාරික සමාගම - 2015/2016**

---

2016 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමාසහිත මහවැලි සත්ත්ව ව්‍යාපාරික සමාගමේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත්කල යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සිදුකරගෙන යාම සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලි වරලත් ගණකාධිකාරී සමාගමක් මට සහාය විය.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ(“අධ්‍යක්ෂ මණ්ඩලය”)වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී.

**1.4 ව්‍යාචනය කළ මතය සඳහා පදනම**

---

(අ) ස්ථාවර වත්කම් භෞතික සත්‍යාපනයේදී වත්කම් කේතනය කර නොතිබීම හා ස්ථාවර වත්කම් ලේඛනය ඉදිරිපත් නොකළ බැවින් රු.19,940,735ක් වූ ස්ථාවර වත්කම්වල පැවැත්ම හා රු.3,940,179ක් වූ සමාලෝචිත වර්ෂයේ ක්ෂය වටිනාකමෙහි නිවැරදිතාවය තහවුරු කළ නොහැකි වීම.

(ආ) සමාලෝචිත වර්ෂයේ තොග ගණනය භෞතිකව නිරීක්ෂණය කිරීමට දැන්වීමක් විගණනයට නොකළ අතර සමාලෝචිත වර්ෂයේ තොග වාර්තාද ඉදිරිපත් නොකෙරුණි.එම නිසා මූල්‍ය ප්‍රකාශනවල තොග වටිනාකම ලෙස දක්වා තිබුණු රු.32,588,479ක අගය, පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගයෙන් වඩා අඩු අගයට ගෙන ඇත්ද යන්න තහවුරු කළ නොහැකි විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට රු.1,994,461 ක වාසි දායක ශේෂයක් හා රු.626,494ක අයිරා ශේෂයක් ඇති සමාගම විසින් පවත්වාගෙන යනු ලබන බැංකු ගිණුම් 2ක් සඳහා බැංකු සනාථ කිරීමේ ප්‍රකාශ ඉදිරිපත් නොකෙරුණි

(ඈ) ඉන්වොයිසි,භාණ්ඩ ලැබීමේ තුණ්ඩු වැනි මූලාශ්‍ර ලේඛන සහ විස්තරාත්මක උප ලේඛන විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා 2016 මාර්තු 31 දිනට වෙළඳ හා ගෙවිය යුතු රු.79,644,860 ක අගයෙහි නිවැරදිතාවය තහවුරු කළ නොහැකි විය

(ඉ) සමාගම විසින් තක්සේරු වර්ෂ 2006 /2007 සිට 2015/2016 දක්වා ගෙවිය යුතු ආදායම් බද්ද ,ආර්ථික සේවා ගාස්තු හා ජාතිය ගොඩ නැංවීමේ බද්ද එකතුව රු.24,140,168ක් වූ අතර ඒ සඳහා බදු වාර්තා පිළියෙල කොට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ලබාදීමක්ද සිදු කර නොතිබුණි

(ඊ) ප්‍රධාන කාර්යාලීය ශේෂ පිරික්සුමේ දක්වා ඇති රු.22,805,110ක් වන ණයගැති පාලන ගිණුම්වලට අදාල ලෙජර ගිණුම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි

**2.** **මූල්‍ය ප්‍රකාශන**
---------------

**2.1** **ව්‍යාවනය කළ මතය**
----------------------

මෙම වාර්ථාවේ මතය ව්‍යාවනය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

**2.2** **වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව**
--------------------------------------------------------------------------------------

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තිය ප්‍රකාරව මා විසින් පහත සඳහන් කරුණු දක්වමි.

(අ) මතය සඳහා පදනම හා විගණනයේ විෂය පථය සහ සීමා කිරීම් ඉහත දක්වා ඇති පරිදි වේ.
(ආ) මාගේ මතය වනුයේ,

- විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා හට ලබා ගැනීමට නොහැකි වූ අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් ඇති බව නිශ්චය කිරීමට මා හට නොහැකි විය.

- මෙම වාර්තාවේ මතය ව්‍යාවනය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන, 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූල බව.

**2.3** **නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**
---------------------------------------------------------------------------------------------

පහත සඳහන් නීති රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ක සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | මුදල් රෙගුලාසි 1647 | වාහන ලේඛනයක් සමාගම විසින් පවත්වා නොතිබුණි |
| (ආ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒ අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක උපකරණ හා මෘදුකාංග සඳහා ලේඛනය සකස් කර නොතිබුණි |
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| | 2.2.4( ඉ) | ප්‍රධාන ගණන් දීමේ නිළධාරියා භෞතික හා මූල්‍ය කාර්ය සාධනය යන දෙකම සංයුක්ත සැලැස්ම සමග |

| | |
|---|---|
| | සමාලෝචනය කර ඒ අනුව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි |
| 4.2.6 ඡේදය | කාර්තුව අවසන් වී දින 30 ක් ඉක්මයාමට පෙර කාර්තුමය ප්‍රගති වාර්තාව රේඛීය අමාත්‍යාංශයට හා මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. නමුත් එසේ ඉදිරිපත් කර නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

----------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

-------------

පෙර වර්ෂයේ සමාගමේ මෙහෙයුම් තුලින් ලද ලාභය රු.15,264,327 සමග සමාලෝචිත වර්ෂයේ අලාභය රු. 13,256,699 සැසඳීමේදී රු.28,521,026 ක පසුබෑමක් සමාලෝචිත වර්ෂයේදී දක්වා තිබුණි.පසුගිය වසර සමග සැසඳීමේදී විකුණුම් ආදායම රු.9,556,014කින් අඩුවීම සහ විකුණුම් පිරිවැය රු.17,038,559කින් වැඩිවීම මෙම පසුබෑමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි

**4. මෙහෙයුම් සමාලෝචනය**

--------------------------

**4.1 කාර්යසාධනය**

---------------

**4.1.1 සැලසුම් කිරීම**

--------------

2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2014 ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම පිළියෙළ කර නොතිබුණි.තවද සමාලෝචිත වර්ෂය සඳහා කාර්ය සාධන වාර්තා පිළියෙළ කර නොතිබිණ.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

--------------------------------

සමාලෝචිත වර්ෂය තුළ භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීමෙන් තොරව රු.7,680,000ක් වටිනා ණය ශේෂයක් කපා හැර තිබුණි

**4.3 කාර්ය මණ්ඩල පරිපාලනය**

----------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 9.3.1 ඡේදය ප්‍රකාරව බඳවාගැනීමේ හා උසස්වීමේ පටිපාටිය සමාගම විසින් පිළියෙල කර නොතිබුණි

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

--------------------------------------------

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-----------------------------------

2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී/12 හි 6.5.1 ඡේදය ප්‍රකාරව මූල්‍ය වර්ෂය අවසන් වී දින 60ක් ඇතුලත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත්තේ මාස 25ක පමාවකින් පසු එනම් 2018 ජුලි 25 දිනය

### 5.2 ප්‍රසම්පාදන සැලැස්ම

-------------------------

2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 4.2.1ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සමාගම විසින් පිළියෙළ කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

---------------------------

විගණනයේදී නිරීක්ෂණයවූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු වියයුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ප්‍රසම්පාදන කළමනාකරණය | භාණ්ඩ හා සේවා මිලදී ගැනීම ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට පටහැනිව සිදු කර තිබුණි. |
| (ආ) ගිණුම්කරණය | මුර පදයන් පවත්වාගැනීමට හා දත්ත ගබඩා පවත්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. ජ'නල වවුචර පිළියෙළ කිරීමට කටයුතු කර නොතිබුණි |